ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>වප් පුන් **පොහෝ** දිනය සමරමින් ඉන්දියාවේ **පොහොසත්** බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය **ඌව** පළාතට ළඟා වේ</u>

කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් නව වන වරටත් සංවිධානය කරන ලද ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය වප් පුන් පොහෝ දින ඔක්කම්පිටිය දමෙටමල් විහාරයේදී පැවැත්විණ. මෙම ප්‍රදර්ශනය පූජ්‍ය ගල්ටැම්වත්තේ පුඤ්ඤානන්ද හිමියන් සහ හම්බන්තොට ඉන්දිය කොන්සියුලර් ජනෙරාල් හරිවින්දර් සිං මහතා විසින් විවෘත කරන ලදී.

2. බුද්ධ චරිතයේ වැදගත් අවස්ථාවන් සහ ඉන්දියාවේ වැදගත් බෞද්ධ සිද්ධස්ථානවල ඡායාරූප රැසක් මෙම ප්‍රදර්ශනයට ඇතුළත් වේ.

3. ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ මෙම ප්‍රදර්ශන මාලාව මෙම වසරේ නවම් පොහෝ දින සිට සෑම පොහෝ දිනකදීම දිවයින පුරා විවිධ විහාරස්ථානවල පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය මේ දක්වා පහත විහාරස්ථානයන්හිදී පවත්වා ඇත.

නවම් පොහෝ දිනය - කළුතර බෝධි පරිශ්‍රය (කළුතර)
මැදින් පොහෝ දිනය - ශ්‍රී සම්බෝධි මහා විහාරය (කොළඹ)
බක් පොහෝ දිනය - පරම ධම්ම චේතිය පිරිවෙන (රත්මලාන)
වෙසක් පොහෝ දිනය - ධර්මරාජ පිරිවෙන (මාතලේ)
පොසොන් පොහෝ දිනය- උමන්දාව බෞද්ධ විශ්ව ගම්මානය (කුරුණෑගල)
ඇසළ පොහෝ දිනය - මුතියංගන රජමහා විහාරය (බදුල්ල)
නිකිණි පොහෝ දිනය - අස්ගිරි මහා විහාර පිරිවෙන (මහනුවර)
බිනර පොහෝ දිනය - වැවුරුකන්නල බුදුරාජ මහා විහාරය (දික්වැල්ල)

4. මෙම සෑම ප්‍රදර්ශනයක් සඳහාම බැතිමතුන් විශාල සංඛ්‍යාවක් සහභාගී වූ අතර ඔවුහු මෙම ප්‍රදර්ශනයේ ආධ්‍යාත්මික සහ සංස්කෘතික වැදගත්කම අගය කළහ. මෙම මූලපිරීම දෙරට ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීමට සහ මිත්‍රත්වයේ සහ සහයෝගීතාවයේ ඉපැරණි බැඳීම් ඉහළ නැංවීමට ගන්නා ඒකාබද්ධ ප්‍රයත්නයන් සවිමත් කරමින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගැඹුරු සංස්කෘතික සබඳතාවය සහ දෙරට විසින් බෙදා හදා ගන්නා උරුමය ඉස්මතු කරයි.

***

**කොළඹ**
***2024 ඔක්තෝබර් 17***